දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 18 /2013

මගේ අංකය : ඩී1/විවිධ/2011,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2013/05/ 13

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීවරුන් වෙත.

**ආයතන සංග්‍රහයේ XLVIII වෙනි පරිච්ඡේදයේ 31 වගන්තිය අනුව**
**<u>රාජකාරී වැඩ තහනමකට භාජනය කිරීම</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වෙනි පරිච්ඡේදයේ 31:1 වගන්තිය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව 31:1:1 වගන්තියේ සිට 31:1:14 දක්වා වගන්තිවලින් ආවරණය වන විෂමාචාරයන් සහ විෂ මත්ද්‍රව්‍ය, මත්පැන්, දුම්කොළ, දුම්වැටි, ජංගම දුරකථන ආදිය බන්ධනාගාර තුළට රැගෙන යාම හෝ නිලධාරීන් සන්තකයේ තිබී සොයා ගැනීම, බන්ධනාගාර නේවාසිකයින් අනිසි ලෙස වැඩවල යෙදීමට කටයුතු කිරීම යන වරදවල් යම්කිසි නිලධාරියෙකු හෝ නිලධාරිනියක විසින් කරනු ලැබුවහොත් අදාළ සිද්ධිය සිදුවූ වහාම මා වෙත දුරකථනයෙන් දන්වා, මගේ ආවරණ අනුමැතියට යටත්ව එදිනම වැඩ තහනම් කර, 31:1 සහ 31:3 වගන්තීන් අනුව කටයුතු කළ යුතුය.

03.මෙම නියෝග තරයේ ක්‍රියාත්මක කිරීමට සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ සහකාර බන්ධනාගාර අධිකාරින් කටයුතු කළ යුතු අතර, එසේ කටයුතු නොකරන යම් නිලධාරියෙක් වෙතොත් ඔහුට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

04. අදාළ සිද්ධිය සම්බන්ධව අතුරු වාර්තාවක් සිද්ධිය සිදුවූ දින සිට දින 02ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු අතර, සතියක් ඇතුළත මූලික පරීක්ෂණ වාර්තාවක් මා වෙත ඉදිරිපත් කළ යුතුය. යම්හෙයකින් අදාළ වාර්තා අදාළ කාලවකවානු අනුව ඉදිරිපත් නොකරන්නේ නම් ඊට හේතු ද මා වෙත වාර්තා කළ යුතු බව දන්වමි.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්